25-07-2016

11 ශ්‍රේණිය

# නාට්‍ය හා රංග කලාව I / පැය එකයි
# Drama and Theatre I / One hour

උපදෙස් :

★ සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සැපයිය යුතු ය.

★ **01** සිට **40** තෙක් ප්‍රශ්නවල දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරා ගන්න.

නම:- පංතිය:- අංකය:-

Learning Resource Centre
Kandana

★ **පහත දැක්වෙන පද්‍ය ආශ්‍රයෙන් අංක 1 සිට 5 තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

(i) අත්තක පිපි මලක් ලෙසේ - පෙත්තක ඇඳි ඉරක් ලෙසේ
සත්තක මගේ පුතුගෙ යසේ - නෙත් දෙක හැර බලන් මෙසේ

(ii) ඉර සායන කල මොනරිඳු දෙදෙනෙක් - ඉරට නැමී වඳිනෙයි
මොනරිත් මොනරත් පිල් විදහාගෙන - සූරිය රුකුළ ගනෙයි
රුළ රුළ, රුකුළත් රුකුළ ගනෙයි

(iii) ගම්බිර කාලිංග නුවර නිරිඳුගෙ වාසල පුරයට
ඉන්න දනා සේ ම රජුට සෝදා පට පිළී සොඳට
ඉන් නරනා තැබුනට මට පේඩිවිදානේ සත්තට
මං මෙතනට ආමි වියන් බඳිනට නරනිඳු එන විට

(iv) රුදුරු මරු යකා මුගුරක් ගෙන අතට
විදුරු කරු දෙකා මෙන් නෙත් රුවිය මට
ඇඳුරු මට දැකා නර බිල්ල ගන්නට
පැදුර පිට තැබුවා යකුට කන්නට

01. ඉහත (i) වැනි පද්‍ය අයත් වන්නේ කවර නර්තන / නාට්‍ය සම්ප්‍රදායට ද?
(1) සොකරි (2) කෝලම් (3) රටයකුම (4) සන්නියකුම

02. ඉහත (ii) වැනි පද්‍යය,
(1) සවුදමකි. (2) රබන් පදයකි. (3) වන්නමකි. (4) නෙළුම් කවියකි.

03. ඉහත (iii) වැනි පද්‍යය ගයනු ලබන්නේ,
(1) සොත්තානා විසිනි. (2) බම්මන්නා විසිනි.
(3) ජසයා විසිනි. (4) ආඬිගුරා විසිනි.

04. ඉහත (iv) වැනි පද්‍යය අයත් වන්නේ,
(1) රාම මැරීම නම් නර්තනාංගයට ය. (2) සන්නියකුමට ය.
(3) සූනියම් යාගයට ය. (4) දෙවොල් මඩුවට ය.

05. ඉහත සියලු ම පද්‍ය අතුරෙන් ආඝාතාත්මක ව ගායනා කළ හැකි පද්‍ය අංක වන්නේ,
(1) (i), (iii), (iv) ය. (2) (ii), (iii), (iv) ය. (3) (i), (ii), (iii) ය. (4) (i), (ii), (iv) ය.

* 06 සිට 10 තෙක් ප්‍රශ්නවලට නිවැරදි පිළිතුරු සපයන්න.

06. පුද්ගලයෙක් තවත් පුද්ගලයකු සමඟ ඇස්වල සම්බන්ධතාවය සෘජු ව පවත්වාගෙන යාමට අපොහොසත් වේ නම්, එය ඔහුගේ පුද්ගල පෞරුෂයේ තිබෙන දුර්වලතාවයකි. මෙය නළුවකුට කිසිසේත් නුසුදුසු ය. මෙම දුර්වලතාව මග හරවාගැනීමට සුදුසු ම අභ්‍යාසය වන්නේ,
(1) සංවේදන අභ්‍යාසයකි. (2) ශිථිලකරණ අභ්‍යාසයයි.
(3) දර්පණ අභ්‍යාසයයි. (4) හිමකන්ද දියවීමේ අභ්‍යාසයයි.

07. සංස්කෘත නාට්‍යයට පමණක් සුවිශේෂ වූ භාෂණවිධිය කුමක් ද?
(1) ආත්මගත භාෂණය (2) ඒකල භාෂණය
(3) ආකාශ භාෂිතය (4) සමූහ භාෂණය

08. ග්‍රීක නාට්‍යයේ ප්‍රධාන තැනක් ගත් අභිනය කුමක් ද?
(1) ආංගික අභිනය ය. (2) වාචික අභිනය ය.
(3) සාත්ත්වික අභිනය ය. (4) ආහාර්ය අභිනය ය.

09. නාට්‍යයක අත්‍යවශ්‍ය අංගත්‍රය වන්නේ,
(1) අධ්‍යක්ෂවරයා, පෙළ හා නළුවෝ ය. (2) අධ්‍යක්ෂවරයා, ආනුෂංගික ශිල්පීන් හා නළුවෝ ය.
(3) නාට්‍ය පෙළ, සංගීතය හා ප්‍රේක්ෂකයෝ ය. (4) නාට්‍ය පෙළ, නළුවන් හා ප්‍රේක්ෂකයෝ ය.

10. නිහිඟ චාල්ස් ඩයස් විසින් රචනා කොට නිෂ්පාදනය කරන ලද නාට්‍ය වන්නේ,
(1) දස්කොන්, උත්තරරාම චරිතය, නලරාජ චරිතය, ශ්‍රී වික්‍රමරාජසිංහ ය.
(2) රෝමියෝ ජුලියට්, සිංහබා කතාන්තරය, දිනකර නෘත්‍යය, බැලසන්ත ය.
(3) පණ්ඩුකාභය, දුටුගැමුණු, පද්මාවතී, සිවම්මා ධනපාල ය.
(4) ප්‍රතාප්සිං, සිංහල වීරයා, විධුර, දියසේන ය.

පහත දැක්වෙන වගුව ආශ්‍රයෙන් 11 සිට 16 තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

| නාට්‍යයේ නම | රචකයාගේ නම | පරිවර්තනය / අනුවර්තනය | මෙරට නිෂ්පාදක |
|---|---|---|---|
| දි එල්ඩර් කින් | ඇලෙක්සැන්ඩර් වැම්පිලෝව් | පුත්‍ර සමාගම | 'ක' |
| රන් ෆෝ යුවර් වයිෆ් | රේ කූනී | 'ග' | බන්දුල විතානගේ |
| අ ස්ට්‍රීට් කාර් නේම්ඩ් ඩිසයර් | 'ජ' | වෙස්මුහුණු | ධම්ම ජාගොඩ |
| ද මැරේජ් | නිකොලායි ගොගොල් | 'ට' | විශ්ව විද්‍යාලයීය සිංහල සමිතිය |
| 'ඩ' | එව්ගිනි ශ්වාර්ට්ස් | මකරාක්ෂයා | ධර්මසිරි බණ්ඩාරනායක |
| වේටිං ෆෝ ගොඩෝ | සැමුවෙල් බෙකට් | ගොඩෝ එනකං | 'ණ' |

11. ඉහත වගුවේ 'ක' කොටුවට ඇතුළත් විය යුතු නිෂ්පාදකගේ නම කුමක් ද?
(1) බන්දුල ජයවර්ධන (2) ජයලත් මනෝරත්න
(3) රංජිත් ධර්මකීර්ති (4) ප්‍රේමරංජිත් තිලකරත්න

12. ඉහත වගුවේ 'ග' කොටුවට ඇතුළත් විය යුතු නාට්‍යයේ නම කුමක් ද?
(1) සොහොයුරියන් තිදෙනා (2) හිතහොඳ අම්මණ්ඩි
(3) රෝමය ගිනි ගනී (4) හරිම බඩු හයක්

13. ඉහත වගුවේ 'ජ' කොටුවට ඇතුළත් විය යුතු නාට්‍ය රචකයාගේ නම කුමක් ද?
(1) ටෙනසී විලියම්ස් (2) ෂෝන් පෝල් සාත්‍රේ
(3) ඒ. ෆර්ගියුසන් (4) ගාර්ෂියා ලෝර්කා

14. ඉහත වගුවේ 'ට' කොටුවට ඇතුළත් විය යුතු නාට්‍යයේ නම කුමක් ද?
(1) වෙරිවත්ත (2) කපුවා කපෝති (3) මඟුල් ප්‍රස්තාව (4) මහ ගෙදර

15. ඉහත වගුවේ 'ඩ' කොටුවට ඇතුළත් විය යුතු නාට්‍යයේ නම කුමක් ද?
(1) රූඩෙන්ස් (2) ද ලෝවර් ඩෙප්ත්ස්
(3) ද ඩ්‍රැගන් (4) ද ඩෙත් ඔෆ් අ සේල්ස්මන්

16. ඉහත වගුවේ 'ණ' කොටුවට ඇතුළත් විය යුතු මෙරට නිෂ්පාදකගේ නම කුමක් ද?
(1) විජිත ගුණරත්න (2) ධම්ම ජාගොඩ
(3) ප්‍රියංකර රත්නායක (4) ජේ.ඒ. සෙල්වදොරේ

★ **17 සිට 21 තෙක් ප්‍රශ්නවලට නිවැරදි පිළිතුරු සපයන්න.**

17. '**සතර අභිනය**' යන්නට **නොගැළපෙන** ප්‍රකාශය කුමක් ද?
(1) වාචික, ආංගික, සාත්ත්වික හා ආහාර්ය යන නම්වලින් හැඳින්වේ.
(2) විශේෂයෙන් නාට්‍යයේ දී යොදාගැනේ.
(3) යුරෝපයේ බිහි වී පෙරදිගට සංක්‍රමණය වූ සංකල්පයකි.
(4) මුල් වරට සාකච්ඡාවට භාජන වන්නේ භරතමුනිගේ නාට්‍යශාස්ත්‍රයෙහි ය.

18. නාට්‍යය ඉදිරිපත් කරනු ලබන ශෛලිය හා අනුගත විය යුතු **නොවන** සාධකය කුමක් ද?
(1) සංවාද (2) රංගාලෝකය (3) සංගීතය (4) අංගරචනා

19. 'වේදිකා නාට්‍යයක්' යන්නට **නොගැළපෙන** ප්‍රකාශය කුමක් ද?
(1) කිසියම් ආකාරයක ජීවිතය අනුකරණය කිරීමකි.
(2) කලා ප්‍රභේද කිහිපයක සංකලනයෙන් බිහි වූවකි.
(3) සෑම විට ම සිද්ධි කාලානුරූපී ව ගොනුකොට ඉදිරිපත් කරන්නකි.
(4) ඕනෑ ම වැඩිහිටි ප්‍රේක්ෂක පිරිසකට ගෝචර විය යුත්තකි.

20. කොහොඹාකංකාරියට අයත් **නොවන** පෙළපාළි වන්නේ,
(1) අඹවිදමන (2) ගුරුගේ මාලාව (3) ඌරා යක්කම (4) ගබඩා කොල්ලය

21. 'රංගභූමි අලංකරණය' යන්නට **නොගැළපෙන** ප්‍රකාශය කුමක් ද?
(1) එහා මෙහා ගෙන යාමට, සවි කිරීමට හා ගැලවීමට පහසු අයුරින් සකස් විය යුතු ය.
(2) 'පුස්ත' යන නමින් ද හැඳින්වේ.
(3) සෑම නාට්‍යයකට ම අත්‍යවශ්‍ය අංගයකි.
(4) නාට්‍යයක යොදනු ලබන සෑම රංගභූමි අලංකරණයක් ම නාට්‍ය ක්‍රියාවලිය හා බද්ධ විය යුතු ය.

★ **පහත දැක්වෙන සංවාද ඛණ්ඩය කියවා, 22 සිට 25 තෙක් ප්‍රශ්නවලට නිවැරදි පිළිතුරු සපයන්න.**

රංබරණා (i) මට නං තේරෙන්නේ නෑ පුතේ මේවයේ අගක් මුලක්. ගහෙන් ගෙඩි වන්නා වගේ මේවා නැති භංගස්ථාන වෙලා යාවි කියලා හීනෙන්වත් හිතුව ද? මේ තරම් නිවී හැනහිල්ලේ මේ තරම් සාමකාමී ව හිටපු අපට මොකක් ද මේ පාත් වෙච්ච හෙණ ගෙඩිය?

බාලබණ්ඩාර (ii) අප්පච්චි කවදාවත් මගේ ප්‍රශ්න තේරුංගන්නේ නෑ.

| | | |
|---|---|---|
| රංබරණා | (iii) | මොකවද උඹට තියෙන ප්‍රශ්න? ඉන්ට හිටින්ට තැනක් තියෙනව නම්, කන්ට බොන්ට කුඹුරක භුක්තිය තියෙනව නම්, ජීවත් වෙන්ට ශිල්ප ශාස්තරයක් උගන්නල තියෙනව නම් ..... මොනව ද උඹට තියෙන ප්‍රශ්න? |
| බාලබණ්ඩාර | (iv) | මෙන්න ප්‍රශ්න පත්තරේ. එක දෙක තුන කියල මට ඒවා කියාගන්ට බෑ අප්පච්චි. ඒවා තේරුං ගන්නව මිසක්. |
| රංබරණා | (v) | අම්මා නැතිවුණා කියලවත් මං උඹට පොඩි සන්දියේ ඉඳල අබමල් රේණුවක අඩුවක් පාඩුවක් කරල තියෙනව ද? රෑ පාන්දරින් නැගිටල කියල, උයල පිහල, උඹව ලක ලෑස්ති කරල ජෑක් පීරල, පවුඩර් දමල ඉස්කෝලෙ උස්සගෙන ගිහින් ඉගැන්නුවේ කවුද? ලෙඩක් දුකක් හැදුනුදාක මුළුතුන් තිස් පැය ම නිදිවරාගෙන උඹව නැළෙව්වේ කවු ද ? උඹේ ම ආශාවට උඹේ කකුල් දෙක බිම වදිනකලුත් උඹව වඩාගෙන නුග ගහ යටට වෙලා හුරතල් කෙරුවේ කවුද? |
| බාලබණ්ඩාර | (vi) | මං ඒවා අමතක කරනව නෙවී අප්පච්චි. |
| රංබරණා | (vii) | උඹෙන් මේ පොඩි එකාට ඉෂ්ට වෙනවද ඔය යුතුකම් කිසිවක් මං? අම්මා කෙනෙක් ඉඳලවත් ඌට තියේ ද උණුසුමක් නිසියාකාර ව? |
| බාලබණ්ඩාර | (viii) | මට තේරෙන්නේ නෑ අප්පච්චි. මම ජීවත් වෙන්ට ඕනෑ වර්තමානෙ. සුවඳ දුම් අල්ලලා, කරඬුවකින් වහගෙන වගේ ආරස්සා කරන අප්පච්චිලාගෙ සම්ප්‍රදාය ගැළපෙන්නෙ නෑ අදට! මට නිදහසක් නැද්ද මගේ කාලයේ මට ජීවත් වෙන්ට? |

22. මෙතෙක් පැවැති සන්සුන් පරිසරය බිඳ වැටීමේ බියක් පළ වන්නේ කවර සංවාද කොටසෙන් ද?
(1) (i) (2) (ii) (3) (iii) (4) (iv)

23. ගැටුම්කාරී තත්ත්වය නිසා නුදුරු අනාගතයේ කුමක් වේදෝ යන කුතුහලය ඇතිවන බව පෙන්වන සංවාද කොටස කුමක් ද?
(1) (v) (2) (vi) (3) (vii) (4) (viii)

24. තමන් නවීන පන්නයට අනුව ජීවත් විය යුතු බව ප්‍රකාශ කෙරෙන්නේ කවර සංවාද කොටසෙන් ද?
(1) (i) (2) (ii) (3) (v) (4) (viii)

25. මේ සංවාද ඛණ්ඩයෙන් පිළිබිඹු වන්නේ,
(1) ඇති නැති පරතරයයි. (2) පරම්පරා ගැටුමයි.
(3) හොඳ හා නරක අතර ගැටුමයි. (4) උගතුන් හා නූගතුන් අතර ගැටුමයි.

★ **26 සිට 30 තෙක් ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර සපයන්න.**

26. සාමූහික ව කටයුතු කිරීමේ හැකියාව වර්ධනය කරගත හැක්කේ,
(1) ශ්වසන අභ්‍යාස මගිනි. (2) ඇවිදීමේ අභ්‍යාස මගිනි.
(3) සංගීත පුටු තරග මගිනි. (4) රංග ක්‍රීඩාවල යෙදීමෙනි.

27. වර්තමානයේ භාවිත **නොවන** රංගාලෝක උපකරණය කුමක් ද?
(1) ධාරා පහන් (2) කිට්සන් පහන්
(3) යොමු පහන් (4) බබිල් මැෂිනය හෙවත් බුබුළු යන්ත්‍රය

28. සිංහලයෙන් රචනා වූ ප්‍රථම නාඩගම ලෙස සැලකෙන්නේ කුමක් ද?
(1) කාලගෝල නාඩගම (2) බ්‍රිම්ගෝඩ් නාඩගම
(3) කුස නාඩගම (4) ඇහැළේපොළ නාඩගම

29. ලෝක ප්‍රකට 'හංසවිල' (Swan Lake) අයත් වන්නේ කුමන නාට්‍ය ගණයට ද?
(1) බැලේ (2) ඔපෙරා (3) මුද්‍රානාට්‍ය (4) ගීතනාටක

30. කටහඬ හා වචන උච්චාරණ පුහුණුව සඳහා වඩාත් යෝග්‍ය ග්‍රන්ථය වන්නේ,
(1) මඟුල් ලකුණ, ලෝවැඩ සඟරාව හා ගුත්තිල කාව්‍යයයි.
(2) සුභාෂිතය, ගණදෙවි හෑල්ල හා වදන්කවි පොතයි.
(3) සකස්කඩ, බුද්ධගද්‍යය හා නම්පොතයි.
(4) මහාවංසය, දීපවංසය හා ථූපවංසයයි.

25-07-2016
11 ශ්‍රේණිය
නාට්‍ය හා රංග කලාව

★ **පහත දැක්වෙන ඡායාරූප දෙක ආශ්‍රයෙන් 31 සිට 34 තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

Learning Resource Center
R
De Mazenod College
Kandana



**ක**



**ග**

31. මෙහි '**ක**' රූපයෙන් දැක්වෙන්නේ,
(1) බී.ඒ. ඩබ්ලිව්. ජයමාන්න ය.
(2) සී.දොන්. බස්තියන් ය.
(3) එස්. මෞනගුරු ය.
(4) එදිරිවීර සරච්චන්ද්‍ර ය.

32. මෙහි '**ග**' ඡායාරූපයෙන් දැක්වෙන්නේ,
(1) එස්. විද්‍යානන්දන් ය.
(2) කේ. සිවතම්බි ය.
(3) කුලන්දෙයි ෂන්මුගලිංගම් ය.
(4) එස්. මෞනගුරු ය.

33. රංග ශෛලීන් තෝරා ගැනීමේ දී මේ නාට්‍යකරුවන් දෙදෙනා ප්‍රකට කළ ලක්ෂණය වූයේ,
(1) දේශීය ගැමි නාටක ඇසුරෙන් රංග සම්ප්‍රදායක් ගොඩනගා ගැනීමයි.
(2) සංස්කෘත නාට්‍ය සම්ප්‍රදාය ඇසුරෙන් රංග සම්ප්‍රදායක් ගොඩනගා ගැනීමයි.
(3) බටහිර රංග රීතිය පදනම් කරගත් රංග සම්ප්‍රදායක් ගොඩනගා ගැනීමයි.
(4) ඔවුන් දෙදෙනා විසින් ම නව රංග සම්ප්‍රදායක් ගොඩනගා ගනු ලැබීමයි.

34. මෙම සිංහල නාට්‍යකරුගේ ආභාසය ලබා දෙමළ නාට්‍යකරු විසින් රචනා කරන ලද නාට්‍යය වන්නේ,
(1) අපසුරම් ය.
(2) වේතාලම් ය.
(3) රාවණේසන් ය.
(4) එන්තයුම් තායුම් ය.

★ **පහත දැක්වෙන වෙස්මුහුණු දෙක ආශ්‍රයෙන් 35 සහ 36 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**



**ක**



**ග**

35. මෙහි දැක්වෙන වෙස්මුහුණු දෙක අතුරෙන්,
(1) '**ක**' සන්නි මුහුණකි, '**ග**' කෝලම් මුහුණකි.
(2) '**ක**' කෝලම් මුහුණකි, '**ග**' සන්නි මුහුණකි.
(3) 'ක' හා 'ග' සන්නි මුහුණු දෙකකි.
(4) 'ක' හා 'ග' කෝලම් මුහුණු දෙකකි.

36. මෙම වෙස් මුහුණු දෙක,
(1) අමුක්කු සන්නිය හා පොලිස් කෝලමයි.
(2) පොලිස් කෝලම හා ගුල්ම සන්නියයි.
(3) පොලිස් කෝලම හා අණබෙර කෝලමයි.
(4) හේවායා සහ වාත සන්නියයි.

★ පහත දැක්වෙන ඡායාරූප ආශ්‍රයෙන් අංක 37 සිට 40 තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

ක



ග



37. ඉහත 'ක' ඡායාරූපයෙන් දැක්වෙන්නේ,
    (1) ලලිතා සරච්චන්ද්‍ර ය. (2) සෝමකාන්තා ය.
    (3) සෝමලතා සුබසිංහ ය. (4) සුමිත්‍රා පීරිස් ය.

38. 'ක' ඡායාරූපයෙන් දැක්වෙන කාන්තාව ප්‍රසිද්ධියක් උසුලන්නේ,
    (1) නූර්ති ශිල්පිනියක වශයෙනි. (2) ළමා නාට්‍ය නිෂ්පාදකවරියක වශයෙනි.
    (3) ශෛලීගත නාට්‍ය නිෂ්පාදකවරියක වශයෙනි. (4) චිත්‍රපට අධ්‍යක්ෂවරියක වශයෙනි.

39. ඉහත 'ග' ඡායාරූපයෙන් දැක්වෙන්නේ,
    (1) වජිරා චිත්‍රසේන ය. (2) මිරැන්ඩා හේමලතා ය.
    (3) කෝකිලදේවි වීරතුංග ය. (4) සිරිමතී රසාදරී ය.

40. 'ග' ඡායාරූපයෙන් දැක්වෙන කාන්තාව ප්‍රසිද්ධියක් උසුලන්නේ,
    (1) මුද්‍රානාට්‍ය ශිල්පිනියක ලෙස ය.
    (2) ග්‍රැමෝෆෝන් යුගයේ ගායිකාවක ලෙස ය.
    (3) කථකලී හා භරතනාට්‍ය ශිල්පිනියක හා ආචාර්යවරියක ලෙස ය.
    (4) කථක් නර්තන ශිල්පිනියක හා චිත්‍රපට නිළියක ලෙස ය.

# 11 ශ්‍රේණිය .

## නාට්‍ය හා රංග කලාව II / පැය දෙකයි

## Drama and Theatre II / Two hours

Learning Resource Center De Mazenod College Kandana

★ පළමුවන ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න. 25.07.2016

01. **පහත දැක්වෙන සංවාද ඛණ්ඩය කියවා, අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

(නුග ගසට ඉහළින් සඳ පායා ඇත. රංබරණා සහ හේතු ගෙයි ඉදිරිපස මිදුලේ වාඩි වී කතාබහේ යෙදී සිටිති.)

රංබරණා : ආරා තල් ගස ගොන් වැඩුණා සේ
මෝරා තල් මල එන අන්දන්
පීරා වරලස අවුල් හරින සේ
තල මල සුළඟට යන අන්දන්

හේතු : (එම කවිපද යළි ගයමින්) ලොකු අත්තේ, ලොකු අත්තා කොහොම ද ඔය තරම් ලස්සනට කවි සීපද, වන්නං කියන්ට ඉගෙන ගත්තේ ?

රංබරණා : ලොකු අත්තගෙ අප්පච්චිගෙන්

හේතු : කිරිමුත්තේ !!

රංබරණා : අන්න හරි. කිරි මුත්තගෙන් තමයි. අත්තා, මුත්තා, නත්තා, පනත්තා, කිත්තා, කිරිකිත්තගෙ ඉඳලා ඕවා කටින් කට ගෙනාපුවා

හේතු : කිරි මුත්තේ !!

රංබරණා : නැටුං ශිල්පෙ විතරක් නෙවි කොල්ලෝ. ජෝතිසේ, වෙදකම, බලි තොවිල්, කොහොඹා කංකාරි..... ඔය ඕනෑ එහෙකට හපන්නු අපේ පරම්පරාව. කන්ද උඩරට කීර්ති ශ්‍රී රාජසිංහ මහරජ්ජුරුවන්ගෙ දේවින්නාන්සෙට වෙදකං කරල තියෙනව අපේ මී මුත්තෙක්. ඒවාට නම්බු නාම, ගම්බිම්, පදවි තානාන්තර ලබල තියෙනවා.

හේතු : ලොකු අත්තා මොනවා ද ඒ කාලෙ කළේ?

(i) හේතු රංබරණා ගේ කවුද? (ලකුණු 01 යි)

..........................................................................................

(ii) රංබරණා විසින් ගායනා කරන ලද කවිය කුමන වර්ගයේ ජන කවියක් ද? (ලකුණු 01 යි)

..........................................................................................

(iii) රංබරණා ප්‍රගුණ කර ඇත්තේ කවර ශිල්පය ද? (ලකුණු 01 යි)

..........................................................................................

(iv) රංබරණා ගේ පරපුරේ ශිල්පය පැවැත-ගෙන ආයේ කෙසේ ද? (ලකුණු 01 යි)

..........................................................................................

..........................................................................................

(v) 'අප්පච්චි' යන්නට සාමානාර්ථය දෙන වචන **දෙකක්** ලියන්න. (ලකුණු 01 යි)

..........................................................................................

..........................................................................................

(vi) මෙම නාට්‍යයට පසුබිම් වන්නේ ලංකාවේ කවර ප්‍රදේශය ද? (ලකුණු 01 යි)

.......................................................................................................

(vii) රංබරණා ගේ පරපුර ප්‍රසිද්ධියක් ඉසුලූ ප්‍රධාන ශිල්පයට අමතර ව, එම පරපුර ප්‍රවීණත්වයක් දැරූ වෙනත් ශිල්ප ශාස්ත්‍ර කවරේ ද? (ලකුණු 01 යි)

.......................................................................................................

(viii) මෙම සංවාද ඛණ්ඩයේ ඇතුළත් ශාන්තිකර්මයක් නම් කරන්න. (ලකුණු 02 යි)

.......................................................................................................

(ix) මෙහි දක්වා ඇත්තේ ආරම්භයේ තිරය විවර වුණාට පසු ව එන මුල් ම සංවාද ඛණ්ඩයයි. එම දර්ශනයේ පසුබිම සකසා ඇත්තේ කවර ආකාරයට ද? (ලකුණු 01 යි)

.......................................................................................................

.......................................................................................................

(x) මෙම නාට්‍යකරු විසින් රචිත තවත් නාට්‍ය **දෙකක්** නම් කරන්න. (ලකුණු 02 යි)

.......................................................................................................

.......................................................................................................

02.



(i) මෙම ඡායාරූපයෙන් දැක්වෙන ශාන්තිකර්මය නම් කරන්න. (ලකුණු 03 යි)

.......................................................................................................

(ii) එම ශාන්තිකර්මය ප්‍රචලිත ලංකාවේ කවර ප්‍රදේශයක ද? (ලකුණු 03 යි)

.......................................................................................................

(iii) මෙම රංග අවස්ථාව පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

.......................................................................................................

.......................................................................................................

.......................................................................................................

.......................................................................................................

.......................................................................................................

03. 'සමාරෝපය' යනු වේදිකා නාට්‍ය කලාවට අයත් වැදගත් සංකල්පයකි.

(i) 'සමාරෝපය' යන්න පහදන්න. (ලකුණු 02 යි)

.......................................................................................................

.......................................................................................................

.......................................................................................................

(ii) එහි ප්‍රභේද නිදසුන් ඇසුරෙන් තහවුරු කරන්න. (ලකුණු 04 යි)

.......................................................................................................

.......................................................................................................

.......................................................................................................

(iii) එම අවස්ථාවට අවතීර්ණ වීමට නළුවකු අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග මොනවා ද? (ලකුණු 06 යි)


04. ගැටුම යනු ප්‍රේක්ෂක ආකර්ෂණය වඩාත් දිනාගත හැකි අවස්ථාවකි.

(i) නාට්‍යයක ගැටුම යන්න පහදන්න. (ලකුණු 03 යි)

(ii) ''ගැටුම'' ප්‍රභේද කැර දක්වන්න. (ලකුණු 04 යි)

(iii) ඔබ නැරඹූ ලංකාවේ ප්‍රසිද්ධ නාට්‍යයක් ඇසුරෙන් එකී ගැටුම් ප්‍රභේද **තුනක්** දැක්වෙන අවස්ථා නිදසුන් මගින් විස්තර කරන්න. (ලකුණු 05 යි)

05.



(i) මෙම රංග භූමිය කුමන නාට්‍ය විශේෂය සඳහා භාවිතා කරන ලද්දක් ද? (ලකුණු 02 යි)

(ii) මෙම නාට්‍ය විශේෂයේ ප්‍රභවය පිළිබඳ ඇති මතවාද මොනවා ද? (ලකුණු 04 යි)

(iii) උක්ත ගැමි නාටක විශේෂයේ රංග ශෛලිය පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

.............................................................................................................

.............................................................................................................

.............................................................................................................

.............................................................................................................

.............................................................................................................

.............................................................................................................

.............................................................................................................

06. ආහාර්ය අභිනය නළු කාර්යයේ දී ඉතා වැදගත් මෙහෙයක් ඉටු කරයි.

(i) ''ආහාර්ය අභිනය'' යන්න කෙටියෙන් හඳුන්වන්න. (ලකුණු 03 යි)

.............................................................................................................

.............................................................................................................

.............................................................................................................

.............................................................................................................

.............................................................................................................

(ii) ආහාරය අභිනයට අයත් ප්‍රධාන අංග තුන නම් කරන්න. (ලකුණු 03 යි)

.............................................................................................................

.............................................................................................................

.............................................................................................................

(iii) නළුවාගේ රංග කාර්යය වඩාත් ඔපවත් කර ගැනීමට ආහාර්ය අභිනයෙන් සිදු වන පිටිවහල විමසන්න. (ලකුණු 06 යි)

.............................................................................................................

.............................................................................................................

.............................................................................................................

.............................................................................................................

.............................................................................................................

.............................................................................................................

.............................................................................................................

07. පහත දැක්වෙන කතා සැකිල්ල ඔබට කැමති පරිදි අවසානයක් කරා ගෙනයමින් නාට්‍ය පෙළක් රචනා කරන්න. මෙහිදී ඔබට අවශ්‍ය පරිදි චරිත සංඛ්‍යාව අඩු වැඩි කැරගත හැකි ය.

තමා හින්දි නිළියක තරම් රූමත් යැ යි සිතා සිටින සඳරේඛා ගේ එක ම අභිප්‍රාය වූයේ රිදී තිරයේ නිළියක වීම ය. තම පාසලේ අධ්‍යයන කටයුතු නිසි ලෙස නොකිරීම නිසා ඇයට ගුරුවරුන් හා යහළු - යෙහෙළියන් කිහිප විටක් ම අවවාද කළ ද, ඕ නිළියක වීම සඳහා දහවල් සිහින දැකීම නතර නොකළා ය. දිනක් පුවත්පතක දැන්වීමකට අනුව ඕ ආධුනික නිළියන් තෝරා ගැනීමේ සම්මුඛ පරීක්ෂණයක් සඳහා අයැදුම් පතක් දැම්මා ය. එතැන් සිට ඕ සම්මුඛ පරීක්ෂණය සඳහා ලිපිය පැමිණෙන තුරු මග බලා සිටියා ය....

(i) නාට්‍යෝචිත අවස්ථා නිර්මාණය සඳහා (ලකුණු 04 යි)

(ii) සංවාද සහ රංගවිධාන සහිත ව පෙළ රචනා කිරීම සඳහා (ලකුණු 08 යි)